## 7. ශීර්ෂය 5 - අමාත්‍ය මණ්ඩල කාර්යාලය

### 7.1 විසර්ජන ගිණුම

#### 7.1.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු රු.5,925,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 14 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 83 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 7.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 7.2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

#### 7.2.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

#### 7.2.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

#### 7.2.4 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

### 7.3 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාලය 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා

විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

## 7.4 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථාවක් පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
| --- | --- | --- | --- |
| | රු. | | |
| ලේඛන සංරක්ෂණය හා කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | 5,000,000 | 2012 | ව්‍යාපෘතියේ විෂය පථය පුළුල් කිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘතිය නැවත සැලසුම් කළ යුතුව ඇති බව දක්වා තිබුණි. |

## 7.5 කළමනාකරණ දුර්වලතා

ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ සහ ස්ථාවර වත්කම් ලේඛනයේ වාහන ආරම්භක ශේෂය අතර රු.258,950 ක් හා අනෙකුත් වත්කම් අතර රු.862,931 ක වෙනසක් පැවතුණි.

## 7.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 17 | 11 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 10 | 05 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 32 | 20 | 12 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 32 | 26 | 06 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 06 | - | 06 |
| | එකතුව | 91 | 68 | 29 | 06 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 29 ක් පැවති අතර කොන්ත්‍රාත් පදනමින් 06 දෙනෙකු බඳවා ගෙන තිබුණි.